# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1644/12 - 2010 මාර්තු 10 වැනි බදාදා - 2010.03.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

පක්ෂ සාමාජිකත්වය අහෝසි වීම හේතු කොට ගෙන ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවේ සභිකයෙකුගේ ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

හින්නේගෙදර පියරත්න නම් වූ සභිකයා අයත්වන එක්සත් ජාතික පක්ෂය නම් වූ, පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට, දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තකු නාමයෝජනා කිරීමට ඉහත කී ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තකු වන වසන්ත සුසිල් බණ්ඩාර රත්නායක මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී එස්. එම්. සමන් බන්දුලසේන වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, වසන්ත සුසිල් බණ්ඩාර රත්නායක මහතා ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එස්. එම්. සමන් බන්දුලසේන,
තේරීම්භාර නිලධාරී,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව.

2010 මාර්තු මස 01 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
අනුරාධපුරය.

03-813


1A - G 12580 — 345 (2010/03)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.